(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 105.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ඔක්තෝබර් මස 05 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

77/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2014.07.01 දින සිට ආනයනය තහනම් කරනු ලැබූ ආහාර සඳහා යොදන රසකාරක වර්ග කවරේද;

(ii) එම එක් එක් රසකාරක වර්ගය, තහනම් කිරීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත තහනම් කළ රසකාරක මෙන්ම, අජිනමොටෝ නොහොත් මොනෝසෝඩියම් ග්ලූටමේට් (MSG) රසකාරකය ද මිනිස් සිරුරට අහිතකර බවත්;

(ii) එය පිළිකා, ස්නායු ආබාධ ඇතුළු දරුණු රෝගාබාධ සඳහා හේතු කාරක වන බවත්;

(iii) වසරකට එම රසකාරක මෙට්‍රික් ටොන් 2200කට වැඩි ප්‍රමාණයක් මෙරටට ආනයනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මොනෝසෝඩියම් ග්ලූටමේට් භාවිතය තහනම් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

446/'16

2.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය අඩවියේ, සමනලගම ප්‍රදේශයේ පයිනස් ගස් 7000ක් කපා ඉවත් කරමින් සිටින බවත්;

(ii) නාවලපිටිය, මාපාකන්ද අක්කර 200කට සහ දොලොස්බාගේ, මල්ගොල්ල අක්කර 50කට අයත් පයිනස් ගස් පුද්ගලික වෙළෙඳුන් මඟින් කපා ඉවත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බවත්;

(iii) දොලොස්බාගේ, පරගල කොටසේ ගස් 2500ක් පමණක් ඉවත් කිරීමට අවසර ලබාගෙන ඇතත්, මේ වනවිට අනවසරයෙන් ගස් 12,000ක් පමණ කපා ඉවත් කොට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සියළුම ගස් ඉවත් කිරීම සඳහා අවසර ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් සහ ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එමගින් රජයට අයවිය යුතු විශාල මුදලක් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(iii) එම වංචා සහගත ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

602/'16

3.

ගරු ලකී ජයවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීම සඳහා පාර්ලිමේන්තුව මඟින් පනතක් සම්මත කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පනතට අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ(i) හි සඳහන් පනතට අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන, පෞද්ගලික රෝහල් ලියාපදිංචිය, ඖෂධ හා වෛද්‍ය රසායනාගාර නියාමනය සහ වෛද්‍යවරුන්ගේ සුදුසුකම් ප්‍රදර්ශනය කිරීම ආදී කටයුතු වර්තමානයේදී නිසි ලෙස සිදු නොවන බව පිළිගන්නේද;

(ii) එම පනතේ නියමයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

611/'16

4.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කළ කරුංකා ප්‍රමාණය;

(ii) ඒවායේ වටිනාකම;

(iii) අපනයනකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන්;

(iv) එක් එක් අපනයනකරු අපනයනය කළ ප්‍රමාණය හා වටිනාකම;

(v) එක් එක් අපනයනකරු රජයට ගෙවූ බදු මුදල;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 වසරේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ කරුංකා ප්‍රමාණය;

(ii) ඒවායේ වටිනාකම;

(iii) ආනයනකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන්;

(iv) එක් එක් ආනයනකරුවන් ආනයනය කළ ප්‍රමාණය හා වටිනාකම;

(v) ආනයනය කළ රට;

(vi) එක් එක් ආනයනකරු රජයට ගෙවූ බදු මුදල;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කරුංකා නිෂ්පාදනය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිවිරෝධී ලෙස කරුංකා ප්‍රති අපනයන ක්‍රියාවලියක් ශ්‍රී ලංකාව හරහා සිදුවන බවත්, එමඟින් දේශීය කරුංකා නිෂ්පාදකයන් සහ අපනයනකරුවන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත් පිළිගන්නේද;

(iii) මෙම නීතිවිරෝධී ප්‍රති අපනයනය වැළැක්වීමට රජය ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

617/’16

5.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි තිරුක්කේදීස්වර කෝවිල හින්දු ජනතාවගේ ශුද්ධ වූ පූජනීය ස්ථානයක් බවත්;

(ii) තිරුක්කේදීස්වර කෝවිලට ඉතා ආසන්නව පිහිටි කනපතිපිල්ලෙ විජයකුමාර් මහතාට අයත් ඉඩමෙහි නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නීතිවිරෝධීව ඉදිකරන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

639/’16

6.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නීතිවිරෝධීව ලබාගත් රාජ්‍ය වත්කම් අත්පත් කර ගැනීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයන් කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම බලකායේ ප්‍රධානියා කවුරුන්ද;

(ii) එය පිහිටුවීමේ අරමුණ කවරේද;

(iii) එහි සාමාජිකයන් හෝ සහායක නිලධාරීන් සංචාරය කර ඇති විදේශීය රටවල් කවරේද;

(iv) සාමාජිකයන් හෝ සහායක නිලධාරීන්ගේ විදේශ සංචාර සඳහා 2016 මාර්තු 31 වැනි දිනට වැය වූ මුළු මුදල කොපමණද;

(v) බලකායේ තීරණ මත 2016 මාර්තු 31 වැනි දිනට නැවත අත්පත් කරගෙන ඇති නීතිවිරෝධීව ලබා ගෙන තිබූ වත්කම්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

660/'16

7.

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පාසල්වල ඇතැම් විදුහල්පතිවරු හා ගුරුවරු විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොයෙකුත් අසාධාරණකම්වලට හා ශාරීරික සහ මානසික වධ හිංසනවලට ලක් කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එසේ මානසික හා ශාරීරික පීඩාවන්ට ලක් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මානසික හා ශාරීරික පීඩාවන් වැළැක්වීමට සහ ඔවුන්ගේ විනයානුකූල හැසිරීම පිළිබඳව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා දැනුවත් කර ඔහු සමඟ සාකච්ඡා කර කිසියම් පියවරක් ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

670/'16

8.

ගරු බිමල් රත්නායක මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර සාම්පූර් බලාගාරය ඉදිකිරීම සඳහා කවර හෝ ගිවිසුමක්, එකඟතා ලියවිල්ලක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) ඒ සඳහා ලබා දුන් කැබිනට් අනුමතිය හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) සාම්පූර් බලාගාරය නඩත්තුව සඳහා ඉන්දු - ලංකා ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කර තිබේද;

(v) එසේ නම්, එම සමාගමේ වත්කම් හා කළමනාකාරීත්වයට අදාළ එකඟතා හා කොන්දේසි කවරේද;

(vi) සාම්පූර් බලාගාරය සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vii) එම ඉඩමේ සිතියමක් (Plan) සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

820/'16

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සේනානායකපුර ග්‍රාම නිලධාරි වසමේ, ඩී. එස්. සේනානායක වීදියේ, 4 වන මාවතේ සිතියම් අංක 280007 සහ කැබලි අංක 686 සහ බලපත්‍ර අංක අම්/වා/බ 1369 දරන ඉඩමෙහි සෝමදාස සෙල්ලහේවා යන අය විසින් වෙළඳසලක් පවත්වාගෙන ගිය බවත්;

(ii) 1991 වර්ෂයේදී මෙම ඉඩම පොදු කටයුත්තක් සඳහා රජයට පවරා ගත් බවත්;

(iii) එහි පොදු කටයුත්තක් සිදු නොවූ බැවින්, අම්පාර සහකාර ඉඩම් කොමසාරිස් විසින් වසර 30ක් සඳහා තක්සේරු කර රු.171,050/-ක් සහ මිනින්දෝරු ගාස්තු වශයෙන් රු.1,450/-ක් ලබාගෙන නැවත සෝමදාස සෙල්ලහේවා මහතාට ඉඩම භුක්ති විඳීමට අවසර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ඉඩම සෝමදාස සෙල්ලහේවා මහතාට අයත් ඉඩමක්ද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) එහි වෙළඳසලක් පවත්වාගෙන යන ලද්දේ කවර දිනයක සිට කවර දිනයක් දක්වාද;

(iv) එම ඉඩම රජයට පවරා ගැනීමක් සිදු කර තිබේද;

(v) එම ඉඩම පවරා ගන්නා ලද්දේ කුමන පොදු කටයුත්තක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

524/'16

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ කෝපි වගා කරන භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වර්ෂ පහ තුළ කෝපි නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම කෝපි මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් කෝපි ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කෝපි නිෂ්පාදනය ඉහළ දැමීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවට කෝපි ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, පසුගිය වසර පහ තුළ ආනයනය කළ කෝපි ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව කෝපි අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, පසුගිය වර්ෂ පහ තුළ අපනයනය කළ කෝපි ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

647/'16

11.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "යොවුන් පුරය 2016" උත්සවය පැවැත්වීමේ අරමුණු කවරේද;

(ii) එහි ප්‍රචාරණ කටයුතු සඳහා දරන ලද වියදම් කොපමණද;

(iii) එක් එක් ප්‍රචාරණ ආයතනයට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) "යොවුන් පුරය 2016" සඳහා වියදම් කළ මුළු මුදල එක් එක් ශීර්ෂය යටතේ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම උත්සවය පැවැත්වීමෙන් රජය අපේක්ෂා කළ අරමුණු ඉටු වී යැයි සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

736/'16

12.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 28 දිනැති අංක 1973/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 4),—1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ නියෝග,— 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වගන්තියේ (2) උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ජූනි මස 15 දිනැති අංක 1971/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) උප වගන්තියේ (ඕ) (ක) සහ (ඝ) ඡේද යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/11 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/12 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*16.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1892/41 සහ 2014 දෙසැම්බර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*17.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඌ) වගන්තිය යටතේ ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1904/10 සහ 2015 මාර්තු 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*18.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඎ), (ඏ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*19.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 6),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඕ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 7),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1924/6 සහ 2015 ජූලි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 8),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 9),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 10),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු, 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/6 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*24.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 11),—1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/7 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*25.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*26.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

27.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**